056138
MLPR
2017/11/12
0082

# බලංගොඩ හා රත්නපුර දවුල් වාදන ශෛලීන් අතර තුලනාත්මක අධ්‍යයනයක්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රයේ නර්තනය පිළිබඳ දෑ අවුරුදු ප්‍රාසංගික කලාපති උපාධි පාඨමාලාවේ අවශ්‍යතා පූරණය කරනු පිණිස ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධය යි.

නම : ඩබ්ලිව්.එම්.එච්.ජී. උදය ඉන්දික ටිකිරි බණ්ඩාර වීරකෝන්

ලියාපදිංචි අංකය : DD/MP/DA/09/024

පීඨය : පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

අධ්‍යයන වර්ෂය : 2009/2011

# හැඳින්වීම.

බෞද්ධාගමික පසුබිමක් සහිත ශ්‍රී ලාංකේය සමාජයේ හේරි වාදන කලාවට හිමිවනුයේ සුවිශේෂ ස්ථානය කි. බෞද්ධාගමික වශයෙන් වාදනයේ ප්‍රභවය සිදු වූයේ කි.පූ. 288 දී එ නම් ක්‍රි. පූ. තුන්වන සියවසේ දී පමණ ශ්‍රී මහාබෝධීන් වහන්සේ ලක්දිවට දායාද වීමත් සමඟ ය. එහි දී උන්වහන්සේ වෙනුවෙන් දහ අට කුලයක ශිල්ප ඥාණය මෙ රට ට දායාද විය. ඒ අතර දවස තුන්යම් වේලේ පූජාව සඳහා හේරී වාදන පූජාව සිදු කිරීම ආරම්භ විය. මෙම බෞද්ධාගමික වාදන කලාව ශිල්පීන් විසින් පසුකාලීන ව හෙවිසි / හේවිසි යන නමින් හඳුන්වනු ලැබී ය. හේවිසි වාදනය සඳහා දවුල තම්මැට්ටම හොරණෑව අත්‍යවශ්‍ය භාණ්ඩ විය. අතීතයේ පටන් ලක්දිව ඉතිහසගත තොරතුරු එවකට රාජ්‍ය පාලකයන්, මහා සංඝ රත්නය සහ ප්‍රභූ පිරිස් විසින් ලේඛන ගත කර තිබේ. මෙම නිබන්ධයේ පළමු පරිච්ඡේදයෙන් එකී ලේඛන මූලික කර ගනිමින් සාහිත්‍යයික විමර්ශනය කර පර්යේෂණට තොරතුරු රැස් කිරීමට උත්සුක විය. එම තොරතුරු ලිඛිත සාධක ප්‍රාථමික හා ද්විතික මූලාශ්‍රය යටතේ ද, අලිඛිත සහ අමුද්‍රිත සාධක යටතේ ද විග්‍රහ වේ.

පසුකාලීන ව බෞද්ධාගමික මුහුණුවරින් පරිබාහිර ක්‍රියා සඳහා ද වාදන භාණ්ඩ යොදා ගත්හ. දවුල ඒ අතර මුඛ්‍ය ස්ථානයක පැවතුණි. දවුල මූලික කොටගත් නර්තන සම්ප්‍රදායක් ද මෙ රට ස්ථාපිත වීම, ඊට ප්‍රධාන හේතු විය හැකි ය. එහෙයින් ලාංකේය හේරි වාදන සංස්කෘතිය තුළ හා දේශීය නර්තන සම්ප්‍රදායයක් වූ සබරගමු නර්තන සම්ප්‍රදාය තුළ දවුල නැමැති වාද්‍ය භාණ්ඩය සමාජයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන හා අසන්නට ලැබෙන හඬ අතරට අයත් විය. එහි දී වැඩි වශයෙන් සබරගමු පළාතට ආවේණික දවුල හා සම්බන්ධ වාදන හා නර්තන අවස්ථා සුවිශේෂ විය. සබරගමු නර්තන සම්ප්‍රදාය තුළ විවිධ ශෛලීන් හඳුනා ගෙන ඇත. ඒ අතර රත්නපුර ශෛලීය හා බලංගොඩ ශෛලිය ප්‍රධාන වේ. එකී නර්තන ශෛලින් අතර පැහැදිලි ගතික ස්වරූපයක් එහි මූලික හස්ත හා පාද චලන මගින් හඳුනා ගත හැකි ය. එහෙත් එම ශෛලීන් දෙක තුළ දවුල වාදනයේ දී එ වැනි සුවිශේෂ බවක් ඇති දැයි පිරිස්සීමට අවශ්‍ය විය.

දේශීය වාද්‍ය භාණ්ඩ අතර ගැටබෙරය, පහතරට බෙර වාදනය පිළිබඳ පර්යේෂණාත්මක ව ලිය වී ඇති අතර දවුල වාද්‍ය භාණ්ඩය පිළිබඳ පර්යේෂණාත්මක පොත පත පරිශීලනයට නොමැති බැවින් ඒ පිළිබඳ තිබූ අවශ්‍යතාව දැඩි වීමට හේතු විය. යම් යම් පැරණි පොත පතෙහි දක්වා ඇති දවුල් වාදනයේ සුළු තොරතුරු හැරුණු කොට දවුලේ විස්තරාත්මක හා දවුල් වාදනයේ විස්තරාත්මක තොරතුරු දක්නට නො ලැබේ. සබරගමු නර්තන සම්ප්‍රදායයේ මූලික ශෛලීන් අතර (රත්නපුර හා බලංගොඩ) දවුල් වාදනයේ යම් සුවිශේෂ බවක් ඇත්දැයි සොයා බැලීම අප පර්යේෂණයේ මූලික අභිප්‍රාය විය. මේ නිසා දවුල හා සම්බන්ධ ඉතිහාසගත තොරතුරුවල සිට විවිධ ශෛලීන්හි පද වාදනය දක්වා විමර්ශනය කෙරෙහි අප පෙළඹුණි.

ප්‍රථමයෙන් අප ප්‍රස්තුතයට ලක් දවුල නම් වූ වාදන භාණ්ඩය ප්‍රචලිත සබරගමු පළාත හැඳින්වීම සුදුසු ය. එ බැවින් සබරගමු නාමය අර්ථ විග්‍රහ කිරීමට හා එම පළාතේ භූගෝලීය ලක්ෂණ අනාවරණය කිරීම සඳහා පළමු වන පරිච්ඡේදය යොදා ගතිමු. තත් ප්‍රදේශය ඓතිහාසික වටිනාකමින් යුතු වීමට හේතු හා සබරගමු වැසියන්ගේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ අප දෙවන පරිච්ඡේදයෙන් විග්‍රහ කරන්නෙමු. එහි දී සබරගමුවේ ප්‍රධාන වූ දේව සමූහයා කෙරෙහි අප අවධානය යොමු විය. එම ඇදහීම් හා දේව සමූහයා මූලික වූ චාරිත්‍ර වාරිත්‍ර අතර දවුල හා සබඳතාවක් පවතී. දවුල වාදනය හා පත්තිනි, සමන්, මංගර දෙවියන් බෙහෝ සෙයින් සබදතා පවත්වයි. එසේ ම දවුල මූලික වූ ශාන්තිකර්ම එම දේව ඇදහිම් මත පසුබිම් සැකසී තිබීම ඊට හේතු වේ.

දවුල් වාදන කලාවේ ඉතිහාසය පිරික්සීමට පෙර මෙ රට වාදන කලා ඉතිහාසය ගවේෂණය කිරීමට අප තෙවන පරිච්ඡේදය භාවිත කළෙමු. ඒ සඳහා වාදන කලාවේ ඉතිහාසය මූලාශ්‍රය කිහිපයක් යටතේ සොයා බැලීම පර්යේෂණ කාර්යයේ පහසුව උදෙසා භාවිත කළෙමු. ලාංකේය සාහිත්‍ය මූලාශ්‍රය වන මහා වංශය, චූල වංශය, ථූප වංශය ආදි පෞරාණික පොත පත ද, දේශීය සංදේශ කාව්‍ය පරිශීලනයේ දී උකහා ගත් සාධකයන් ද, පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ හෙළි කරගත හැකි වාදන ඉතිහාසය ද ගවේශනය කළෙමු. තවත් වැඩි වශයෙන් විමර්ශනයේදී ලාංකේය දේවාල විහාර ආශ්‍රිත බිතු සිතුවම් හා මූර්ති ශිල්පය ඔස්සේ පිළිබිඹු වන වාදන කලාවේ ඉතිහාස ගත තොරතුරු මෙම පරිච්ඡේදය පුරාවට සාකච්ඡා කොට ඇත. ඒ මගින් දවුල හා සම්බන්ධ කෙතරම් දිගු අතීත වාදන කලාවක් තිබුණේ දැයි සොයා බැලීමට හැකි වේ.

සිව් වන පරිච්ඡේදයේ දවුලේ ඉතිහාසය හා එහි විකාශනය පිළිබඳ විමසා බැලීමක් සිදු වේ. මෙම පරිච්ඡේදයේදී ප්‍රධාන වශයෙන් දවුලේ ඉතිහාසය ද දවුල් වාදන පරම්පරා පිළිබඳව විමර්ශනය කරයි. දවුලේ උපත, දවුල් සෑදීමේ පැරණි ක්‍රමවේද දවුලක ව්‍යුහය විග්‍රහ කිරීම අප පර්යේෂණ කාර්යයට අත්‍යවශ්‍ය වේ. මක් නිසාදයත් අප පර්යේෂණයේ මුඛ්‍ය වාදන භාණ්ඩය දවුල වන බැවිනි. එහි දී දවුලක් සකසා ගැනීමේ ක්‍රමවේදය ඒ සඳහා තට්ටු (සම්) සකසා ගැනීම, කඩිප්පු හා දවුල සඳහා පාරම්පරික වාද්‍ය ශිල්පීන් යොදා ගන්නා ආරක්ෂක යන්ත්‍ර දැමීම පිළිබඳව ද සාකච්ඡා වේ. මෙම පරිච්ඡේදය මගින් දවුල් වාදන ඉතිහාසය හා වර්තමානය තෙක් එහි විකාශනය විදහා පෑමට අවශ්‍ය සියලු තොරතුරු රැස් කිරීමට හා ඉදිරිපත් කිරීමට දැඩි සේ උත්සාහ ගතිමු.

පස් වන පරිච්ඡේදය සබරගමු දවුල් වාදනයේ මූලිකාංග යනුවෙන් මෙහිදී පර්යේෂණයට ලක් වනුයේ බීජාක්ෂර සම්බන්ධ උපත් සාහිත්‍යය, මූලික අක්ෂර වාදනය හා සරඹ වාදනය වේ. සරඹ වාදනයේ දී ආධුනික ශිල්පියකු විසින් අත්හල යුතු අත් සරඹ, කඩිප්පු සරඹ, මෙන්ම හුරු නුහුරු සරඹ ද, ඒවා භාවිතයේ වැදගත්කම පෙන්වා දෙමින් වාදනයේ දී මතුවන දුෂ්කරතා මඟහරවා ගැනීමට මාර්ග පහදා දීම මෙම පරිච්ඡේදයේ දී සිදු කරයි. ක්‍රමානුකූලව සරඹ අභ්‍යාසයෙන් ලබන්නා වූ පන්නරය මගින් හා අලංකාර පද වාදනයෙන් ශාස්ත්‍රීය දවුල් වාදනයට මාර්ග පහදා දෙයි. එබැවින් අටවට්ටම් පද හා විවිධ

අලංකාර පද කෙරෙහි යොමු කිරීම සිදු කරයි. සබරගමු වාදන කලාවේ ප්‍රධාන තාල පද්ධතියන් කෙරෙහි මූලික අවබෝධය හා තාල පිළිබඳ වාදනයේ පූර්ණ අවබෝධය සමඟ පූජා මංගල දවුල් හා මංගල දවුල් වාදනය, හේවිසි වාදනය අලුයම් දූරය, හැන්දෑ දූරය වාදනය කෙරෙහි අවබෝධය ලබා දීම පස් වෙනි පරිච්ඡේදයේ ගෙන හැර දක්වයි. එමෙන්ම ප්‍රවීණ වාදක ශිල්පියකුට වාදනයේ නිපුනත්වය දැක්වීමට වාදනයේ දී යොදාගනු ලබන සව්දම්, තාලම්, වන්දමානම්, කවුත්තම්, සුරල්, සතර අත වාදනය ආදී බොහෝ සාම්ප්‍රදායික දැනුම් සම්භාරයකින් එම පරිච්ඡේදය පෝෂණය වී ඇත.

මෙම පර්යේෂණයේ අවසාන පරිච්ඡේදය වෙන් වූයේ බලංගොඩ හා රත්නපුර ශෛලීන් ද්විත්වයෙහි වාදනයේ විශේෂතා සාකච්ඡා කිරීමට යි. එහි දී මූලික ව එක් සම්පදයක් තුළ ශෛලීය වෙනස්වීම කෙරෙහි බල පෑ සාදක පිළිබඳ ව මූලික ව සොයා යෑමක් සිදු විය. එහි දී ගුරුකුල අධ්‍යාපනයේ විශේෂතා යටතේ ගල්ලේපිට පරම්පරාව යටතේ ව්‍යාප්ත වූ සියලු නර්තන හා වාදන කලාවන් දෙ ආකාර වීම කෙරෙහි හේතු සාධක ගුරු පරම්පරා හා ප්‍රවීණයන්ගේ සාකච්ඡා ඇසුරින් විස්තර කොට ඇත.

ඉන් අනතරු ව බලංගොඩ හා රත්නපුර වාදන ශිල්පීන් මූලික වාද්‍ය භාණ්ඩය (දවුල) සකසා ගැනීමේ දී දක්වන විශේෂතා පිළිබඳවත්, මූලික පද උච්චාරණයේ දී දැක ගත හැකි පැහැදිලි සම විසමතා විග්‍රහ කරයි. එමෙන්ම වාදනය සඳහා මූලික වූ සරඹ, අත්‍යා බෙර, මගුල් බෙර ආදියෙහි දී තත් ශෛලීන් ද්විත්වයෙහි දැක ගත හැකි පැහැදිලි සුවිශේෂතා පිළිබඳ ව උදාහරණ සහිත ව විග්‍රහ කිරීම සිදු කරන ලදී. සබරගමු නර්තනය හා දවුල වෙන් කොට දැක්වීම කළ නො හැකි බැවින් ශාස්ත්‍රිය නර්තන අංග සඳහා වාදනයේ දී ශෛලීන් ද්විත්වයෙහි දැක ගත හැකි සමාන අසමානතා අප ගවේෂණයේ දී අවධාරණය කර ගත් කරුණු ඔස්සේ විමර්ශනය කරයි. මේ සඳහා මාත්‍රා පහ අඩු කෝල් පද හා පාලි පද කෙරෙහි අවධානය යොමු විය. තව ද වාදනයේ විශේෂතාවන් ලෙස පොදුවේ දැකිය හැකි ය. දැතින් පද වාදනයේ දි හා කඩිප්පු සමඟ වාදනයේ දී පැහැදිලි වෙනස්කම් එ නම් න්‍යායාත්මක නො වන ආකාරයේ වෙනස්කම් මතු කරන බව අප පර්යේෂණයේ දී අවධාරණය විය. අවසාන වශයෙන් සය වෙනි පරිච්ඡේදයේ මෙකී විශේෂතාව විග්‍රහ කිරීමකට ලක් කරන ලදී.

මෙසේ වාදනයේ විශේෂතා විග්‍රහ කොට අප පර්යේෂණයේ සමස්ත සමාලෝචනය ඉදිරිපත් කරයි. එහි දී අප විග්‍රහ කොට ගත් කරුණු ඇසුරින් මෙම වාදන කලාව හා බලංගොඩ, රත්නපුර ශෛලීය වාදනය පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් මෙම පර්යේෂණය ඔස්සේ ඉදිරිපත් කරයි.